# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2479/54 - 2026 මාර්තු මස 12 වැනි බ්‍රහස්පතින්දා - 2026.03.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකු නිවේදන

**2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත**

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 106 සහ 78 (ආ) වගන්ති සමග කියවිය යුතු 105 වන වගන්තිය යටතේ සකස් කළ රීති.

**පී. නන්දලාල් වීරසිංහ,**
පාලක මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති.

2026 මාර්තු මස 11 වැනි දින,
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ.

**සංඛ්‍යා ලේඛන සහ තොරතුරු රැස් කිරීම පිළිබඳ රීති**

1. මෙම රීති "2026 අංක 01 දරන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සංඛ්‍යා ලේඛන සහ තොරතුරු රැස් කිරීම පිළිබඳ රීති" ලෙස හඳුන්වනු ලැබිය යුතු ය.

2. 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ, (මින්මතු "පනත" ලෙස හඳුන්වනු ලබන) 105 සහ 106 වගන්තිවල විධිවිධාන සමග කියවනු ලබන 78 (ආ) වගන්තියේ විධිවිධාන ප්‍රකාර ව ක්‍රියා කරමින්, මහ බැංකුව, සිය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සහ 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ පැවරී ඇති බලතල, කාර්යය සහ කර්තව්‍ය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ සිදු කිරීම සඳහා මහ බැංකුවට අවශ්‍ය වන සංඛ්‍යා ලේඛන සහ තොරතුරුවලට අදාළ රීති මෙයින් නිකුත් කරනු ලැබේ.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. පනතෙහි හෝ වෙනත් ලිඛිත නීතියක විශේෂයෙන් අවසර දී ඇති පරිදි මිස, මහ බැංකුවේ ඕනෑම නියෝජ්‍ය අධිපතිවරයෙකු හෝ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ සංඛ්‍යාන දෙපාර්තමේන්තු ප්‍රධානියා හට (මින් මතු "බලයලත් නිලධාරියා" ලෙස හඳුන්වනු ලබන), පනත යටතේ හෝ තත්කාලයෙහි බලපවත්නා වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ මහ බැංකුවේ බලතල, කාර්යය සහ කර්තව්‍ය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ සිදු කිරීම සඳහා තමන්ට අවශ්‍ය යැයි හැඟෙන සංඛ්‍යා ලේඛන, තොරතුරු, දත්ත හෝ ලියවිලි වාචික ව, ලිඛිත ව හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් (මින්මතු "තොරතුරු" ලෙස හඳුන්වනු ලබන) අදාළ නිවේදනයේ දක්වා ඇති කාල සීමාව තුළ ඉදිරිපත් කරන ලෙස, සපයන ලෙස හෝ ලබා දෙන ලෙස ඕනෑම අවස්ථාවක දී ඕනෑම තැනැත්තෙකුගෙන් ලිඛිත නිවේදනයක් මගින් ඉල්ලා සිටීම නීත්‍යානුකූල වේ. එවැනි තැනැත්තෙකු විසින් සපයන ලද ඕනෑම තොරතුරක නිරවද්‍යතාව තහවුරු කර ගැනීම සඳහා බලයලත් නිලධාරියා විසින් අමතර තොරතුරු ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

4. ඉහත 3 වන රීතිය යටතේ දත්ත එක්රැස් කරන මහ බැංකුවේ බලයලත් නිලධාරියා -

(i) අදාළ ප්‍රකාශන සිදු කෙරෙන තුරු සංඛ්‍යා ලේඛන සහ තොරතුරු මූලාශ්‍රවල රහස්‍යභාවය සුරක්ෂිත කිරීම;

(ii) මහ බැංකුව වෙත ඉදිරිපත් කර ඇති, සපයා ඇති හෝ ලබා දී ඇති සංඛ්‍යා ලේඛන සහ තොරතුරු අදාළ අරමුණ සඳහා පමණක් භාවිත කිරීම තහවුරු කිරීම;

(iii) මෙම රීති යටතේ යම්කිසි විශේෂ පුද්ගලයෙකු හෝ ආයතනයක් විසින් ඉදිරිපත් කර ඇති, සපයා ඇති හෝ ලබා දී ඇති සංඛ්‍යා ලේඛන සහ තොරතුරු පෞද්ගලික ප්‍රතිලාභ වෙනුවෙන් ප්‍රකාශයට පත් නොකිරීම; හෝ

(iv) සංඛ්‍යා ලේඛන සම්පාදනය, විශ්ලේෂණය කිරීම, උපුටා ගැනීම සහ සකස් කිරීමෙහි නියැලීම සඳහා මහ බැංකුව විසින් බලය ලබා දුන් පුද්ගලයකු හැර වෙනත් කිසිම පුද්ගලයෙකුට ඉහත සඳහන් 3 වන රීතිය යටතේ නිකුත් කළ නිවේදනය ප්‍රකාර ව ලැබුණු සංඛ්‍යා ලේඛන සහ තොරතුරු සඳහා ප්‍රවේශවීමට, සමාලෝචනයට හෝ පරීක්ෂා කිරීමට අවසර ලබා නොදීම ;

සිදු කළ යුතු ය.

5. (i) 3 වන රීතිය යටතේ නිකුත් කරන ලද නිවේදනයකට අනුව තොරතුරු සැපයීම ප්‍රතික්ෂේප කරන හෝ එම නිවේදනයට අනුකූල වීම තහවුරු කිරීමට සාධාරණ පියවර නොගන්නා;

(ii) ඉදිරිපත් කරන ලද ඕනෑ ම තොරතුරක නිරවද්‍යභාවය තහවුරු කිරීමට අවශ්‍ය සියලු සාධාරණ පියවර ගැනීමට අපොහොසත් වන;

(iii) 3 වන රීතිය යටතේ නිකුත් කරන ලද නිවේදනය යටතේ මහ බැංකුව වෙත සපයන ලෙස ඉල්ලා සිටින එවැනි සංඛ්‍යා ලේඛන සහ තොරතුරුවල චේතනාන්විත ව අසත්‍ය තොරතුරු ඇතුළත් කිරීම හෝ එවැන්නක් සිදු කරවන; හෝ

(iv) පනත යටතේ තමන්ට පැවරී ඇති බලතල, කාර්යය සහ කර්තව්‍ය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම, හෝ සිදු කිරීම සඳහා එවැනි දත්ත එක්රැස් කරන මහ බැංකුවේ බලයලත් නිලධාරියාට විරෝධය දැක්වීම හෝ බාධා කරන;

ඕනෑම පුද්ගලයකු මෙම නීති උල්ලංඝනය කිරීමක් සිදු කර ඇති බවට සලකනු ලබනු ඇති අතර, එය මෙම පනත යටතේ වරදක් ලෙස සැලකේ.

6. යම් පුද්ගලයෙකු රීති අංක 5 (iii) හෝ (iv) හෝ එම රීති දෙක ම යටතේ වරදක් සිදු කර ඇත්නම්, ඉල්ලුම් කළ තොරතුරු එම පුද්ගලයා විසින් ලබා දෙන තෙක්, අවස්ථාවෝචිත පරිදි, මහ බැංකුව විසින් එම වරද අඛණ්ඩ ව වරදක් ලෙස සලකනු ලැබීම නීත්‍යානුකූල වේ.

7. මෙම රීති, පාර්ලිමේන්තුව විසින් අනුමත කළ දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

8. මෙම රීතිවල අරමුණු සඳහා,

"මහ බැංකුව" යනුවෙන් 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ;

"අධිපතිවරයා" යනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා අදහස් වේ;

“පාලක මණ්ඩලය” යනුවෙන් 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 8 වන වගන්තිය යටතේ පිහිටුවන ලද මහ බැංකුවේ තීරණ ගැනීමේ මණ්ඩලය අදහස් වේ;

“වරදක්” යනුවෙන් මහ බැංකුව විසින් පරිපාලනමය ක්‍රියාමාර්ග ගැනීමට හේතු වන, මෙම රීතිවලින් ඕනෑම රීතියක් උල්ලංඝනය කිරීම හෝ ඊට අනුකූල වීමට අපොහොසත් වීම හෝ මෙම පනත යටතේ අපරාධ දණ්ඩනයකට හේතු වන එවැනි උල්ලංඝනය කිරීමක් හෝ අපොහොසත් වීමක් අදහස් වේ;

“පුද්ගලයා” යන්නට ඕනෑම ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ හෝ අන් ආකාරයකින් පිහිටුවන ලද හෝ නියම කරන ලද, රජයේ ඕනෑම දෙපාර්තමේන්තුවක යම් නිලධාරියකු සහ සංස්ථාපිත හෝ සංස්ථාපිත නොවන ආයතනයක පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ.

EOG 03 - 0128

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.